# නවක වදය/නම්නීකරණ වැඩසටහන් හේතුවෙන් අධ්‍යාපනයට සිදුවන බලපෑම

ඩී.එස්. කොඩිතුවක්කු[1] කේ.පී.කේ. දූලනි[2]
එම්.එන්. ජයවර්ධන[3] කේ.එම්.ආර්.ආර්. මුහන්දිරම්ගේ[4]
ජී.එච්.එච්.එස්. මධුවන්ති[5]

## සංක්ෂේපය

ක්‍රි.ව. 6 සහ 7 වන සියවස් වලදී ආරම්භ වූ නවක වදය ග්‍රීක සමාජයේ ක්‍රීඩා සංගම් මුල්කොට ගනිමින් ආරම්භ වූවක් ලෙස සැලකෙන අතර මෙම වකවානුවේ දී එකී සංගම් වලට පැමිණෙන නවකයින් අතර කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීමේ පරමාර්ථය ඇතිව මෙය ක්‍රියාත්මක විය. කාලයත් සමඟ ඇති වූ විවිධ නවීකරණයනගෙන් පසුව යුධ කඳවුරු තුළ නවක වදය බහුල වශයෙන් දක්නට ලැබිණි. පළමු වන ලෝක සංග්‍රාමයෙන් පසුව යුධ භටයින් උසස් අධ්‍යාපනයට පැමිණීමත් සමඟ විශ්ව විද්‍යාල සංස්කෘතිය තුළට ද ව්‍යාප්ත විය. මෙම නවක වදය යන සංකල්පය වර්තමානය වනවිට ලොව පුරා විවිධ සංවාදයන්ට මෙන් ම සමාජය තුළ විවාදයන්ට තුඩුදුන් මාතෘකාවක් බවට පත් වී ඇත. වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ මේ පිළිබඳ විශාල මතභේදාත්මක සිදුවීම් සමූහයක් සිදුවෙමින් පවතී. 1998 දී නවක වද පනත හේතුකොටගෙන විශ්වවිද්‍යාල නවක වදය නවක නම්නීකරණය බවට පත්විය. මෙහි අධ්‍යයන ගැටලුව වන්නේ මේ ආකාරයට ක්‍රියාත්මක වන නවක වදය/නම්නීකරණය විද්‍යාර්ථීන්ගේ අධ්‍යාපනයට කොතරම් බලපෑමක් වේ ද යන්න අධ්‍යයනය කිරීමයි. මෙම අධ්‍යයන ගැටළුව පදනම් කරගනිමින් කරන ලද අධ්‍යයනයේ අරමුණ වන්නේ අධ්‍යාපන කටයුතු සඳහා නවක නම්නීකරණයෙන් සිදුවන බලපෑම හඳුනාගැනීමත්, ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග යෝජනා කිරීමත්ය. මෙම අධ්‍යයනය කැලණිය විශ්වවිද්‍යාලය මුල්කොට ගනිමින් සිදු කරනු ලැබූ අතර මේ සඳහා සෑම වසරකින් ම 50 දෙනෙකුගෙන් සැදුම්ලත් 200ක නියැදියක් සසම්භාවී ලෙස තෝරා ගෙන අධ්‍යයනයට භාජනය කරන ලදි. අධ්‍යයනයෙන් අනාවරණය වූ පරිදි තෝරාගත් නියැදියෙන් 90% ක් නවක වදයට ලක් වූ බව තහවුරු විය. එයින් 80%ක් පමණ දේශන සඳහා ප්‍රමාද වි පැමිණෙන අතර එයින් 30%ක් ප්‍රමාද වන්නේ නවක වදය/නම්නීකරණය සඳහා වූ වැඩසටහන් හේතුවෙනි. එමෙන් ම නවක වදය/නම්නීකරණය සඳහා වූ වැඩසටහන් හේතුවෙන් 80% කට ම දේශන මඟ හැරී ඇති බව ප්‍රතිඵලවලින් තහවුරු

1 ශාස්ත්‍රවේදී (විශේෂ), සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, dilukodi@gmail.com
2 ශාස්ත්‍රවේදී (විශේෂ), සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, kinsi.gt@gmail.com
3 ශාස්ත්‍රවේදී (විශේෂ), සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, kitmnj@gmail.com
4 ශාස්ත්‍රවේදී (විශේෂ), සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, rashiravihari@gmail.com
5 විද්‍යාවේදී (විශේෂ), අලෙවි කළමනාකරණය, සබරගමුව විශ්වවිද්‍යාලය, harshani0319@gmail.com

විය. මෙම 80% අයත් පිරිසගේ නවක වදය පවතින කාලයේ විභාග ප්‍රතිඵල සහ නවක වදය නොමැති කාලයේ ලබාගත් විභාග ප්‍රතිඵල සඳහා ලකුණු පරීක්ෂාවක් සිදුකළ අතර එයින් 95% කගේ ප්‍රතිඵලය වූයේ ලබාගත් ප්‍රතිඵලවල වෙනසක් නොමැති බවයි. 2 ක් මේ සම්බන්ධව කිසිදු ප්‍රතිචාරයක් නොදක්වන ලදී. එසේම 3%ක් නවක වදය/නම්නීකරණය සඳහා වූ වැඩසටහන් හේතුවෙන් තම විශ්වවිද්‍යාල අධ්‍යාපන කටයුතු සඳහා බාධාවක් වූ බව පවසයි. කෙසේ වෙතත් අධ්‍යයන ප්‍රතිඵලවලින් තහවුරුවන්නේ නවක වදය/නම්නීකරණය විද්‍යාර්ථීන්ගේ විභාග ප්‍රතිඵල සඳහා දැඩිලෙස බලනොපාන නමුදු දේශන කාල මඟහැරීයාම හේතුවෙන් අධ්‍යාපන කටයුතු සඳහා බලපෑමක් එල්ලවන බවයි. මේ අනුව නවක වදය අධ්‍යාපනයට වක්‍රාකාරයෙන් බලපෑමක් එල්ලවන බව පෙනේ. කෙසේ වුවත් විද්‍යාර්ථීන්ගේ බහුතර මතය වන්නේ නවක වදය/නම්නීකරණය මුළුමනින් ම නවතා දැමිය යුතු නැති බවත් එය ක්‍රියත්මක වන ආකාරය මීට වඩා අර්ථවත් මුහුණුවරක් ගත යුතු බවත් ය.

***මූඛ්‍ය පද :*** *නවක වදය, විද්‍යාර්ථීයා, අධ්‍යාපනය, දේශන, ප්‍රතිඵල*